# 2019 ජූලි මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්
# "සමිඳුන් කෙරෙහි මම ප්‍රීති වන්නෙමි. මාගේ ගැළවීමේ දෙවිඳුන් කෙරෙහි ප්‍රීති ප්‍රමෝද වන්නෙමි"

(හබකුක් 3:18)

දෙවියන් වහන්සේ ඔබේ මගේ අබ්බා අම්මා! අබ්බා තාත්තා නම් අප දිවියට අවශ්‍ය වන්නේ වෙන මොනවාද? මේ භාග්‍යවන්ත අත්දැකීමට අපට ඇතුළු විය හැක්කේ අප නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේට අවදි වී ජේසු ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධ වුවොත් පමණි.

මේ කාලය තුළ අප රට තුළ පවතින අර්බුදකාරී තත්ත්වය නිසා රටේ පුරවැසියන් අන්ත අසරණ තත්ත්වයට පත් වී ඇත. දේශ පාලකයන්ගේ කුලල් කා ගැනීම් නිසා රටේ සදාචාරය පිරිහී ඇත. මත්පැන්, මත් කුඩු ජාවාරම්, බලධාරීන් රජයේ ඉඩම් මංකොල්ල කෑම, අන්තර් ජාලය නිසා දරුවන් නොමග යෑම, පවුල් ජීවිත අවුල් වීම, වස විෂ සහිත ආහාර පාන, ටියුෂන් පංති නිසා දරුවන්ගේ සුන්දර ළමා අවදියට බාධා ඇති වීම, ත්‍රස්ත ප්‍රහාර ආදි හේතු නිසා ජනතාව මානසිකව ඇද වැටී ඇත.

මේ හැම ප්‍රශ්නයකටම පිළිතුර ඇත්තේ අප අබ්බා අම්මාට - අබ්බා තාත්තාට කන්නලව් කරන එක පමණි.

> **"සමිඳාණන් වහන්ස, ඔබ සවන් දෙන තෙක්, සවන් දී බලහත්කාරයෙන් අප මුදන තෙක් මම කොපමණ කල් ඔබට මොර ගසම් ද? තාඩන පීඩන හා බලහත්කාරය මා අවටින් ඇත. කලකෝලාහල හා අඬදබර හැම තැන ම ඇත. මෙවැනි හිරිහැර හා නපුරුකම් මට බලා සිටින්නට ඔබ වහන්සේ සලසා ඇත්තේ මන් ද? නීතිය දුර්වල වී ඇත. යුක්තිය කිසි කලෙක ඉටු නොවේ. දුෂ්ඨයන් ධර්මිෂ්ඨයන් යටපත් කර ඇත. යුක්තිය නොපිට පෙරළා ඇත."** (හබකුක් 1:2-4)

මෙම මාසය තුළ අපි හබකුක් දිවැසිවරයා මෙන් අඛණ්ඩව අබ්බා තාත්තාට - අබ්බා අම්මාට අපගේ අයදුම් ඔසවමු. එමෙන්ම ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අප තුළ, අප දේශය තුළ ඉටුවන තුරු අප සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වෙමු.

පළමු සතිය : දිව්‍යමය කියවීම - හබකුක් 3:17-19

අයැදීමට විශේෂ යොමුව :

පසුගියදා ත්‍රස්ත ප්‍රහාරයට ලක් වී මිය ගිය අයගේ නෑදෑ හිතවතුන් හා දැනටමත් තුවාල ලබා රෝහල්වල ප්‍රතිකාර ලබන අය සහ එම සිද්ධිය නිසා මානසික පීඩනයට පත් වී සිටින අය වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* අති උතුම් කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් කිතු දන පුබුදුවේ ආත්මික අධ්‍යක්ෂක වශයෙන් අතිගරු රොබින්සන් විජේසිංහ පියතුමන් පත් කර ඇත. අප එතුමන්ට පුබුදු කැරිස්මාව තේරුම් අරගෙන, පුබුදු ජනතාව නිසි මඟ ගැන්වීමට ශුද්ධාත්ම ප්‍රඥාව ඉල්ලා අයදිමු.
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන්.
* ස්වාමි තාත්තා ඇතුළු දිවැසි එකතුව, සහයක එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්න සියළු දෙනා වෙනුවෙන්.
* සුබැඳි සංඝය වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

දෙවන සතිය : දිව්‍යමය කියවීම - පිලිප්පි 4:4-9

අයැදීමට විශේෂ යොමුව :

ත්‍රස්ත උවදුරුවලට තුඩු දෙන විවිධ උපක්‍රම සහ ප්‍රචණ්ඩ ක්‍රියා සමූලිකව අප දේශයෙන් තුරන් වන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* අප දේශය තුළ සිටින අතිගරු මැල්කම් රංජිත් කාදිනල් තුමා ඇතුළු සියළුම රදගුරු, පූජක, පැවිදි සහ ධර්මදූත සේවාවේ නියැලෙන සියළු දෙනා වෙනුවෙන්.
* ජූලි 13-14 දිනවල ධර්මාරාමයේ පැවැත්වෙන දෙමළ කථා කරන අයගේ ඥානකාන්තිය වෙනුවෙන්.
* ජූලි 13-14 ප්‍රශංසාරාමයේ පැවැත්වෙන ඇතුලාන්ත සුව සම්මේලනයට සහභාගි වන සියළු දෙනා සහ උපස්ථායක කණ්ඩායම වෙනුවෙන්.
* ජූලි 16 වන දින පැවැත්වෙන සුරැඳි දූවරුන්ගේ වාර්ෂික දිනය වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

තෙවන සතිය : දිව්‍යමය කියවීම - පිලිප්පි 3:7-11

අයැදීමට විශේෂ යොමුව :

පුබුදු තරුණ - තරුණියන් සහ ශිෂ්‍ය - ශිෂ්‍යාවන් වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* විදේශ රටවල සිටින පුබුදු ජනතාව වෙනුවෙන්.
* සුබැඳි සංඝය වෙනුවෙන්.
* පිලිකා, වකුගඩු, හෘද්‍යාබාධ ඇතුළු සුව වීමට ප්‍රමාද සියළු රෝගීන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

සතරවන සතිය : දිව්‍යමය කියවීම - යෙසායා 25:6-9

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ජූලි 20-21 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන සියළුම වගකීම් ගන්නා අයගේ කඳවුරට සහභාගි වන සියළුම දෙනා සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* පවුල් ජීවිතවල අර්බුදයන්ට මුහුණ දෙන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

අවධානය සඳහා :

* පසුගියදා වත්තල සාංඝිකයේ දික්ඕවිට ප්‍රශංසා ගමේ පුබුදු සංඝයේ නිහඬ දූත කාර්යයක් කර, විශේෂයෙන් පුබුදු අයැදීම් සේවාවට උද්යෝගිමත්ව ඇතුළු වී අයැදීම් දූත කාර්යයට කැපවී අදත් ස්වාර්ග රාජ්‍යයේ අඛණ්ඩව යැදුමට සම්බන්ධ වූ එච්.ඩී.මයිකල් තාත්තා වෙනුවෙන් දෙවිඳුන් පසසමු.
* නමෝ මරිය 3ක් අයැදීම් එකතුවෙන් පසු උච්ඡාරණය කරන්න.

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************